# අත්තකිලමථානුයෝගය හා ඒ පිළිබඳ බෞද්ධ විචාරය

දේවාලේගම මේධානන්ද හිමි

සංඛ්‍යාවෙන් ද ස්වරූපයෙන් ද විවිධාකාර වූ ආගමික, දාර්ශනික දෘෂ්ටි වාදයන්ගෙන් බුද්ධ කාලීන භාරතය පිරී පැවති බව ප්‍රකට කරුණකි.[1] එහිලා ශාශ්වත උච්ඡේද යන උභයාන්තය ම පදනම් වූ බවද සැලකෙයි. ඒ ආත්මයද ලෝකයද නිත්‍යය, ධ්‍රැවය, ශාශ්වතය, අවිපරිණාමීයැ යි සලකා ගැනීමෙන් ශාශ්වත දෘෂ්ටිය ප්‍රභවය වන්නේ ය. එබඳු නිත්‍ය වූ ආත්මයක් නැතැයි ද සියල්ල මරණයෙන් කෙළවර වේ යැයි ද ආගමික දාර්ශනික දෘෂ්ටියට එළඹීමේ පදනමයි. සමකාලීන සියලු ආගමික දාර්ශනික දෘෂ්ටීන් මෙකී උභයාන්තයෙහිම සංග්‍රහකොට සලකා ගැන්ම වූ කලී විද්‍යාර්ථීන් ගේ සාමාන්‍ය පිළිවෙතය. එහෙත් මෙම උභයාන්තයෙන් එකකට හෝ නොවැටෙන ඇතැම් දෘෂ්ටිවාදයන් ද පැවති බව අප විසින් සලකා ගත යුත්තකි. සමකාලීන චින්තකයන් අතර පැවති චතුෂ්කෝටික තාර්කික භාවිතා අතුරින් සිව්වැන්න මීට එක් නිදසුනක් වේ. සංජය බෙල්ලට්ඨි පුත්තාදීන් ඉදිරිපත් කළැයි සැලකෙන අමරාවික්ෂේප වාදී දෘෂ්ටිය තවත් නිදසුනෙකි.

අත්තකිලමථානුයෝගය වූ කලී පූර්වෝක්ත ශාශ්වත දෘෂ්ටිය න්‍යාය කොටගත් චින්තකයන්ගේ ප්‍රායෝගික චර්යාව යැයි ද සාමාන්‍යයෙන් සැලකෙයි.[2] එහෙත් අප විසින් අමතක නොකළ යුත්තක් නම් ශාශ්වත දෘෂ්ටියෙහි මෙන් ම උච්ඡේද දෘෂ්ටියෙහි ද විවිධ ස්වරූප පැවති බවයි. එකී ප්‍රභේද සමහරක් බ්‍රහ්මජාල සූත්‍රයෙහි දක්වා තිබේ. මෙකී උභය දෘෂ්ටියටම මුල් වූ ආත්මවාදය වූ කලී ශ්‍රමණ බ්‍රාහ්මණ යන දෙපක්ෂය වෙතමැ පැවැතියකි. එසේම දීර්ඝ කාලයක් මුළුල්ලේ සංවර්ධනය වූවකි. ආත්ම වාදයෙහි විවිධ ස්වරූප පිළිබඳ උපනිෂද් අවධියෙන් බොහෝ නිදසුන් ලැබෙයි. සියලු ආත්ම වාදයන් අත්තකිලමථානුයෝගයට පදනම්වී යයි මේ අනුව සැලකිය නොහැකිය. ආත්මවාදයේ විවිධ ස්වරූපයන් ආශ්‍රිතව විවිධ චරණයන් ප්‍රභවය වී යයි සලකා ගත හැකිය. මේ අනුව අත්තකිලමථානු